# ප්‍රජාව තුළ සිදුවන විදෙස් මැදිහත්වීම්

විදේශීය රජයන් වෙතින් සිදුවන මැදිහත් වීම් හා බිය ගැන්වීම් වාර්තා කරන්නේ කෙසේද

**FACTSHEET** / March 2023

**afp.gov.au**

## හැඳින්වීම

විදෙස් මැදිහත් වීම්, ඔස්ට්‍රේලියාවේ පුද්ගලයන්ට, ස්වාධීනත්වයට හා ආරක්ෂාවට මෙන් ම අපගේ ජාතික ආයතනවල ඒකාබද්ධතාවට ද බැරෑරුම් තර්ජනයකි. විදේශීය මැදිහත් වීම් ඔස්ට්‍රේලියානු ප්‍රජාවේ එක් කොටසකට හෝ එක් ප්‍රාන්තයක පමණක් සිදු වන්නක් නොවේ. ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, අධ්‍යාපනය හා පර්යේෂණ; මාධ්‍ය හා සන්නිවේදනය; තීරණාත්මක යටිතල පහසුකම්, හා විශේෂයෙන් ම අපගේ සංස්කෘතිකව සහ භාෂාත්මකව විවිධ ප්‍රජාවන් (CALD) ඇතුළු අංශ ගණනාවක, රජයේ සියලු මට්ටම්වල දී ඔස්ට්‍රේලියානු තීරණ ගැනෙන අංශ ගණනාවක තුළ මැදිහත් කිරීම් සිදු කිරීම සඳහා එදිරිවාදී විදේශීය රාජ්‍ය ක්‍රියාකාරීහු (සෙසු රටවල්වලට එරෙහිව එදිරිවාදී කටයුතු සිදු කරන වෙනත් රටවල්) අවස්ථා නිර්මාණය කරමින් හා බලාපොරොත්තුවෙන් සිටිති.

## ප්‍රජාව තුළ සිදුවන විදෙස් මැදිහත්වීම්

ප්‍රජාව තුළ සිදුවන විදෙස් මැදිහත්වීම් යනුවෙන් හැඳින්වෙන්නේ, ඔස්ට්‍රේලියානු බහුසංස්කෘතික ජීවන රටාවට බලපෑම් සිදු කර එයට හානි කිරීම සඳහා විදෙස් රජයන්ගේ අධීක්ෂණය සහිතව හෝ ඔවුන් අරමුදල් සපයන, CALD ප්‍රජාව ඉලක්ක කරගෙන කෙරෙන තර්ජන හා බියවැද්දීම්ය. විවිධාකාර වූ අරමුණු ගණනාවක් වෙනුවෙන් විදෙස් රජයන් විසින් ප්‍රජාවන් තුළ දී මැදිහත් කිරීම් සිදු කළ හැකිය:

- විදෙස් රජයන්හි අභ්‍යන්තර හා බාහිර ප්‍රතිපත්ති පිළිබඳ සිදුවන විවේචන නිහඬ කරවීමට
- CALD කණ්ඩායම් සාමාජිකයන්ගේ ක්‍රියාකාරකම් (සැබෑ ජීවිතයේ හා මාර්ගගතව) අධීක්ෂණය කිරීමට
- විදෙස් රජයන්හි අදහස් හා ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමට
- විදේශීය රජයන්හි ප්‍රතිලාභය සඳහා තොරතුරු ලබා ගැනීමට
- පුළුල් ප්‍රජාව තුළ අදහස් හා මතවාදවලට බලපෑම් සිදු කිරීම

## ප්‍රජාව සිදුවන විදෙස් මැදිහත්වීම් විවිධ ආකාරයෙන් සිදු විය හැකිය.

පහත දැක්වෙන දේ ඇතුළත් විය හැකිය:

- පහරදීම් හෝ පහරදෙන බවට වන තර්ජන.
- අවමාන තර්ජනය (බ්ලැක්මේල්)
- පැහැරගෙන යාම, නීති විරෝධීව රඳවා තබා ගැනීම හෝ නිදහස අහිමි කිරීම
- දූහුබැඳීම හා අනවශ්‍ය ශාරීරික හා ඉලෙක්ට්‍රොනික ප්‍රවීක්ෂණය
- විදෙස් රටවල සිටින පවුලේ අය හෝ හිතවතුන්ට තර්ජනය කරමින් යමෙක් අනුකූලව කටයුතු කිරීමට බලෙන් පොලඹවා ගැනීම
- කිසියම් කේවල කණ්ඩායමක් අගතියට පත් කිරීමට මාර්ගගතව සිදු කරන ව්‍යාජ ප්‍රචාර ව්‍යාපාර

1995 අපරාධ පනත (Cth), අනුව විදෙස් මැදිහත් වීම් බවට පත් වීම සඳහා අදාළ ක්‍රියාකාරකම, විදෙස් රජයකට හෝ එහි නියෝජිතයෙකුට සම්බන්ධ විය යුතුය. අපරාධකාරීත්වය ඇගයීමේ දී නීති බලාත්මක කිරීමේ අංශ විසින්, ඔස්ට්‍රේලියානු ප්‍රාන්ත හෝ බලප්‍රදේශවල වැරදි ද සලකා බලනු ඇත.

## ඉලක්ක කරන්නේ කාවද?

විදෙස් රජයන් විසින් පහත දැක්වෙන අය ද ඉලක්ක කිරීමට ඉඩ ඇත:

- ඔස්ට්‍රේලියාවේ ජීවත්වන හිටපු හෝ වත්මන් ජාතිකයන්
- දේශපාලනික හා මානව හිමිකම් ක්‍රියාකාරීන්
- විකල්ප මතධාරීන්
- මාධ්‍යවේදීන්
- දේශපාලනික එදිරිවාදිකරුවන්
- ආගමික හෝ ජාතික වශයෙන් සුලුතරයක් වන කණ්ඩායම්

## උපකාර කිරීමට මට කළ හැක්කේ මොනවාද?

ප්‍රජාව තුළ විදේශීය මැදිහත් වීම් පිළිබඳව ලැබෙන සමහර වාර්තා සඳහා ඔස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිසියේ මැදිහත් වීමක් සිදු නොවිය හැකි වුවත්, සෑම වාර්තාවක් ම ඇතිවිය හැකි ගැටලු පිළිබඳව **අදහසක් ලබා ගැනීමට උපකාර කරයි**.

ප්‍රජාව තුළ විදෙස් මැදිහත් වීම සම්බන්ධයෙන් ගැටලු/එවන් අවස්ථා ඇත්නම්, **ජාතික ආරක්ෂක ක්ෂණික ඇමතුම් අංකයට (NSH)**. වාර්තා කළ හැකිය.

- NSH පැය 24 පුරා ම සතියේ දින 7දී ම ක්‍රියාත්මක වන අතර ප්‍රජාව තුළ සිදුවිය හැකි විදෙස් මැදිහත්වීම් ගැන ගැටලු ගැන වාර්තා කිරීමට ඇති මධ්‍යම ඇමතුම් ස්ථානයයි.
- ඔබ ලබා දෙන තොරතුරු සම්බන්ධයෙන් කුමක් කළ යුතුද යන්න NSH දුරකථන ක්‍රියාකරුවන් දැන සිටින අතර, සුදුසු අවස්ථාවල දී ඔවුන් විසින් එම තොරතුරු නීතිය බලාත්මක කිරීමේ සේවාවලට හා ආරක්ෂක ආයතනවලට ඇගයීම සඳහා ලබා දෙනු ඇත.
- NSH දුරකථන ක්‍රියාකරුවෝ සෑම ඇමතුමක් ම බැරෑරුම් ලෙස සලකන අතර, ලැබෙන සියලු ම තොරතුරු අගය කොට සලකති.
- ගැටලුවක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම විශාල පියවරක් බව අපි දැන සිටින්නෙමු. අපි ඔබගේ පෞද්ගලිකත්වය ගැන බැරෑරුම් ලෙස සලකන්නෙමු. ඔබට නිර්නාමිකව සිටීමට අවශ්‍ය නම් ඒ බව දුරකථන ක්‍රියාකරුට දන්වන්න.
- තොරතුරුවල ඇති සංවේදී ස්වභාවය නිසා, ඔබේ ඇමතුමේ හෝ ඊමේල් පණිවුඩයේ ප්‍රතිඵලය පිළිබඳව ඔබට විස්තර නොලැබෙනු ඇත.

ඔබ ලබා දෙන තොරතුර, ප්‍රජාව තුළ විදෙස් මැදිහත්වීම් වැලැක්වීමට AFP අවශ්‍ය වන ඔවුන් සතුව දැනට නැති එහෙත් අවශ්‍ය ම වන විස්තරයක් විය හැක.

**NSH** ඇමතීමට ක්‍රම ගණනාවක් වේ.

- අමතන්න: **1800 123 400**
  - ඔස්ට්‍රේලියාවෙන් බැහැරව: (+61) 1300 123 401
  - TTY භාවිත කරන්නන් සඳහා (ශ්‍රවණ ආබාධ ඇති අය): 1800 234 889

- **ඔබට භාෂණ පරිවර්තකයෙකු අවශ්‍ය නම්, 131 450 ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව (Translating and Interpreting Service) අමතා ජාතික ආරක්ෂක ක්ෂණික ඇමතුම් අංකය අමතන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න**

- කෙටිනි පණිවිඩ
  - කර 0498 562 549 ඔස්සේ ඔබේ තොරත එවන්න.

- ඊමේල්
  - කර hotline@nationalsecurity.gov.au ඔස්සේ ඔබේ තොරත එවන්න.

- තැපැල්:
  - ඔබේ තොරත :
    National Security Hotline
    Department of Home Affairs
    PO Box 25
    Belconnen ACT 2616

## වාර්තා කළ හැකි වෙනත් ආකාරයන්

සුදුසු අවස්ථාවල දී සෙසු මාර්ග ගණනාවක් ඔස්සේ ද ඔබට ගැටලු වාර්තා කළ හැකිය.

- eSafety මගින් මාර්ගගතව ඇති බැරෑරුම් හිංසනකාරී අන්තර්ගත ඉවත් කිරීමට උපකාර කරයි. ඔබට බැරෑරුම් මාර්ගගත හිංසනය සම්බන්ධයෙන් esafety.gov.au/report ඔස්සේ eSafety කොමසාරිස්ට වාර්තා කළ හැකිය.

- ඔබට ඕනෑම ආකාරයක **තර්ජනයක් ඇති බව දැනේ නම් හෝ ආරක්ෂිතබවක් නොදැනේ** නම් ඔබට පහත දැක්වෙන අංක ඇමතිට හැකිය:
  - **The police -** හදිසි අවස්ථා සඳහා **000 ඔස්සේ**
  - **The police - ජීවිත තර්ජන නොමැති අවස්ථා සඳහා පොලිසිය ගෙන්වා ගැනීමට 13 14 44 ඔස්සේ.**

- ඔබට පොදු රාජ්‍යමණ්ඩලීය අපරාධයක් සම්බන්ධයෙන් forms.afp.gov.au/online_forms/report_a_crime හි ඇති මාර්ගගත ආකෘති පත්‍රය භාවිත කරමින් AFP වෙත වාර්තා කළ හැකිය. පොදු රාජ්‍යමණ්ඩලීය අපරාධවලට ඇතුළත් වන දේ ගැන වැඩි දුර තොරතුරු ලබා ගැනීමට afp.gov.au/contact-us/report-commonwealth-crime#What-is-a-Commonwealth-crime වෙත යන්න.

- ඕනෑම ප්‍රජා සාමාජිකයෙකුට, සැක සහිත ඔත්තු සේවය හෝ විදෙස් මැදිහත්වීම් පිළිබඳව AFP ( AFP ප්‍රජා සම්බන්ධතා කණ්ඩායම ද ඇතුළත්ව) සාමාජිකයෙකු සමග සෘජුව ම කතාබහ කළ හැකිය.

## ප්‍රජාව තුළ ඇති විදෙස් මැදිහත් වීම් වාර්තා කිරීම මගින් මට බලාපොරොත්තු විය හැක්කේ කුමක්ද?

AFPට ප්‍රජාව තුළ සිදුවන සෑම විදෙස් මැදිහත් වීම් ගැන වන වාර්තාවක් ම විමර්ශනය කළ නොහැකිය. වෙත ලැබෙන සෑම ඇමතුමක් ම අදාළ ආකාරයට සලකා බලමින් සාපරාධී වරද අදාළ වේ දැයි හඳුනාගැනීම සිදු කරනු ඇත. වාර්තාකව ප්‍රතිඵල මෙසේ විය හැකිය:

- පොලිසියට ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය නීතිමය පර්යන්තයන් සපුරා නොතිබීම නිසා ප්‍රතිචාරයක් නොලැබීම
- AFP විසින් විමර්ශණය කරනු ලැබීම
- වෙනත් පොලිස් සේවයක් හෝ රජයේ ආයතනයක් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම.

ඔස්ට්‍රේලියාවෙන් බැහැරව සිදුවන වැරදිවලට නීතිමය සීමා අදාළ වේ.

## තර්ජනවල ස්වරූප

### ඔබට මුහුණ මුහුණ තර්ජනය කළේ නම්

- සන්නිවේදනය කළ ආකාරයට ම තර්ජනය ලියා තබා ගන්න.
- තර්ජනය සිදු කළ පුද්ගලයා සම්බන්ධයෙන් හැකි තරම් විස්තරාත්මක තොරතුරු වාර්තා කර තබා ගන්න. (නම, ලිංගික සමාජභාවය, උස, බර, හිසකෙස් හා ඇස්වල පැහැය, කටහඬ, ඇඳුම්පැළඳුම්, හෝ වෙනත් විශේෂ ලක්ෂණ)).
- තර්ජනය සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කරන්න.

### දුරකථන මාර්ගයෙන් ඔබට තර්ජනය සිදු කළේ නම්

- හැකි නම්, අවට සිටින අයට ඇසීමට ඉඩ සළසා පොලිසියට අමතන ලෙස සංඥා කරන්න.
- හැකි නම් දුරකථන ඇමතුම පටිගත කරන්න.
- තර්ජනය කළ වචන ඒ ආකාරයට ම ලියා ගන්න.
- දුරකථනයේ ඉලෙක්ට්‍රොනික දසුන් පුවරුවෙන් තොරතුරු පිටපත් කර ගන්න.
- පොලිසිය සමග තොරතුරු සාකච්ඡා කිරීමට සූදානමින් සිටින්න.

### කෙටි පණිවුඩ, සෘජු/පෞද්ගලික පණිවුඩ, සමාජ මාධ්‍ය හෝ ඊමේල් ආදී ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය මගින් තර්ජනය කරනු ලැබුවේ නම්

- පණිවුඩ මකා දැමීම සිදු නොකරන්න.
- පණිවුඩ තොරතුරු මුද්‍රණය කර ගැනීම, ඒවායේ ඡායාරූප ගැනීම, ස්ක්‍රීන්ෂොට් ලබා ගැනීම හෝ තොරතුරු පිටපත් කර ගැනීම සිදු කරන්න. (මාතෘකාව, දිනය, වේලාව, එවන්නා, ආදිය.). තාවකාලිකව පවතින පණිවුඩ සුරැකීම (සේව්) හෝ ස්ක්‍රීන්ෂොට් ලබා ගන්නා බව තහවුරු කර ගන්න.
- ඔබට තර්ජනයක් ලැබී ඇත්නම් කඩිනමින් පොලිසියට දන්වන්න.
- සියලු ඉලෙක්ට්‍රොනික සාක්ෂි සුරක්ෂිතව තබන්න. .

**මෙවන් ආකාරයේ තර්ජනවලින් ඔබට ආරක්ෂා කර ගැනීමට පහත දැක්වෙන උපක්‍රම පිළිපදින්න:**

- නොදන්නා අය එවන ඉලෙක්ට්‍රොනික පණිවුඩ හෝ ඇඳුම් (ඇටෑච්මන්ට්) විවෘත කරන්න එපා.
- සමාජ මාධ්‍යවල දී නොදන්නා හෝ අනාරාධිතව එන පුද්ගලයන් සමග සන්නිවේදනය කරන්න එපා.
- ඔබේ උපාංගයේ/ගිණුමේ ආරක්ෂක සැකසුම් උපරිම ආරක්ෂාවක් ලබා දෙන බව තහවුරු කර ගන්න.
- සයිබර් අපරාධකරුවන්ට ඔබේ ඉලෙක්ට්‍රොනික උපාංග පාලනයට ගනිමින් ඔබේ පෞද්ගලික තොරතුරු අනාවරණ කිරීම සිදු කළ හැකිය.
- අනන්‍යතා සොරකම නිසා ඔබේ ගිණුම් ආරක්ෂා කර ගැනීමට කඩිනමින් ඔබේ මූල්‍යායතනය අමතන්න.
- ශක්තිමත් මුරපද භාවිත කරන්න එසේ ම එකම මුරපදය වෙබ් අඩවි ගණනාවකට භාවිත කිරීම නොකරන්න.
- ඇන්ටි වයිරස් හා ඇන්ටි මැල්වෙයා යෙදවුම් යාවත්කාලීන බව තහවුරු කර ගන්න.
- අවශ්‍ය වන පරිදි පද්ධති හා මෘදුකාංග යාවත්කාලීන කිරීම් සිදු කරන්න.
- ඇතුළු වීමට ආකාර දෙකකින් තහවුරු කිරීමක් භාවිත කරන්න (ටූ ෆැක්ටර් ඔතෙන්ටිකේෂන්)
- නිරන්තරයෙන් දත්ත උපස්ථ (බැක්අප්) කරන්න.
- ඔබේ ජංගම උපාංගය සුරක්ෂිත කරන්න.
- සයිබර් ආරක්ෂාව පිළිබඳ ඔබේ අදහස් හා දැනුවත්බව වර්ධනය කර ගන්න.
- වැඩිදුර තොරතුරු සඳහා, යන්න **cyber.gov.au.**